**ශීර්ෂය - 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අප්‍රේල් 28 ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C ආකෘතිය) දළ පදනමින් පිළියෙල කල යුතු වුවත් විගණනයට ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශය එසේ පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනෙකුත් ආදායම් ගණන්දීමේ නිලධාරීන්ගේ රැස්කර තිබූ රු. 590,730 ක ආදායම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | රු 590,730.ක මූල්‍ය වටිනාකම වෙනත් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දැක්වුවද සත්‍ය වශයෙන්ම එම වටිනාකමට අදාළ අගයන් මුදලින් හෝ මුදල් හා සමාන දෑ වලින් දෙපාර්තමේන්තුවට ලැබී නොමැති බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් නොකරන එම අගයන් හරස් සටහන් වලින් කරන ලද අයකිරීම් වන බව. | මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුළ අත්තිකාරම් අයකරගැනීම් රු . 815,018ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබීම නිසා මුදල් ගලාඒම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | රු 815,018.ක මූල්‍ය වටිනාකම තුළ ඇතුළත් වන්නේ හරස් සටහන් මඟින් ණය සහ අත්තිකාරම් අය කර ගැනීමත් දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වී ගිය සේවකයින්ගේ ණය පවරා දීමත් වන බැවින් මේ තුළ සත්‍ය වශයෙන්ම මුදල් හෝ මුදල් හා සමාන දෑ වල ගලා යාමක් නොමැති බැවින් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් නොකරන ලද බව. | අත්තිකාරම් අයකර ගැනීම් වල දළ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු. 659,980 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු. 221,400ක් ලෙස දක්වා තිබීම නිසා රු. 438,580 ක් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි. | රු. 438,580 ක මූල්‍ය වටිනාකම සත්‍ය වශයෙන්ම මෙම දෙපාර්තමේන්තුවෙන් සේවක ණය සහ අත්තිකාරම් ලෙස ගෙවූ වටිනාකමක් නොවන බැවින් එම වටිනාකම වෙනත් දෙපාර්තමේන්තු වල සිට ස්ථාන මාරු වී පැමිණි සේවකයින්ගේ පවරා ගත් ණය සහ අත්තිකාරම් ගිණුම් වල ශේෂය වන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මෙම වටිනාකම සඳහන් නොකරන ලද බව . | අත්තිකාරම් ගෙවීම්වල දළ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ඇස්තමේන්තුවලට අනුව අවම ලැබීම් සීමාව රු.300,000 ක් වුවත් විගණනයට ඉදිරිපත් කර තිබූ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම 01 හි එකී සීමාව රු.200,000 ක් ලෙස දක්වා සැසඳීම් කර තිබුණි. | 2020 වර්ෂය සඳහා අවම ලැබීම් සීමාව රු.300,000 දක්වා වැඩි කිරීමට ඉල්ලීමක් සිදු කර නොමැති බවත් එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව පිටපත් මුද්‍රණයේ දී සිදු වූ දෝෂයක් විය හැකි බවත්, 2021 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අයවැය ඇස්තමේන්තුවේ සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මුද්‍රිත පිටපත් වල ද සඳහන් වන්නේ රු.200,000 ක් බව ද දන්වා එවා තිබුණි. | අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේදී වාර්ෂික ඇස්තමේන්තු සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාවය |

## 3.2 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 කෙටුම්පත් කාර්යසාධන වාර්තාව අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගැනීමට සහ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා පසුගිය වර්ෂයේ සිට පවතින ලිපිගොනු 02 ක කටයුතු වර්ෂය අවසානය දක්වා නිමවී නොතිබුණු බව නිරීක්ෂණය විය. | නීතිපති උපදෙස් ලබාගැනීම සඳහා පසුගිය වර්ෂයේ සිට පවතින ලිපි 02 ක් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් නීති උපදෙස් ලබා දී නොමැති බව දන්වා එවා තිබුණි. | නීති කටයුතු සඳහා ලැබෙන ලිපිගොනු පිළිබඳව අප්‍රමාදව කටයුතු කිරීමේ අවශ්‍යතාවය |

## 4. **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 19 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 14 ක් වූ බැවින් සේවක සංඛ්‍යාවේ සියයට 26 ක් හෙවත් 05 දෙනෙකු ඌනව පැවති බව නිරීක්ෂණය විය | අධ්‍යක්ෂ ජනරාල් තනතුර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කලයුතු තනතුරක් බවත්, තනතුරු 02 ක් 2020 වර්ෂය තුළදී පුරප්පාඩු වූ බවත් ඉතිරි පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කරන බවත් දන්වා එවා තිබුණි. | මේ අයුරින් කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොමැති නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |